# ලැවෙන්ඩර් සහ කුරුමිට්ටෝ



එයොලි තමීෂා රාජනායක

# ලැවෙන්ඩා සහ කූරුමිට්ටෝ

එයොලි තමීෂා රාජනායක

**ලැවෙන්ඩා සහ කුරුමිට්ටෝ**

කතා ප්‍රකාශනයකි

පළමුවන මුද්‍රණය 2026 .......

කතාව සහ චිත්‍ර

**එයෝලි තමීෂා රාජනායක**

3 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ISBN 978 - 624 - 211 - 194-0

# පිදුම

මාගේ ජීවන කතා පොතේ

මුල් පිටුව ලියා දුන්

ආදරණීය

ප්‍රමිතා වෙත්තසිංහ ගුරු මෑණියනි...

ගුරුතුමිය වී... අම්මාද වී...

එම පිටුවට පාට දුන්

සාදර වත්සලා අමසේන ගුරු මෑණියනි ...

මාගේ අතින් ලියවුණ

මුල්ම පොත

ඔබට බැතියෙන්.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනිය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.


ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව,<br>
2026.05.10

මගේ නම ලැවෙන්ඩා. මට ඉන්නේ අම්මයි, තාත්තයි විතරයි. රෑ වුණා. මට නින්ද ගියේ නෑ. මම අම්මටයි තාත්තටයි හොරෙන් ගෙදරින් එළියට ගියා.
ගෙදරින් එළිය පරිසරය හරිම ලස්සනයි. හරිම සුන්දරයි.

"ගෙවල්වල ලයිට් දාලා හඳ පායලා තරු බැබළෙනවා හරි ම ලස්සනයි" ලැවෙන්ඩා කිව්වා.
මම තව ටික දුරක් ගියා.
මට සීතලක් දැනුනා.
මට සීතල හින්දා බය හිතුණා.





නිදි මතක් ද දැනුණා. මම ළඟ තිබුණු ගහක් යට නිදා ගත්තා.

මම ඇහැරුණා
මම ඇහැරෙන කොට හිටියේ
අමුතුම අමුතු තැනක.

මම වටපිට බැලුවා. කුඩා
ගෙවල් හතක් තිබුණා. ඒ
වගේ ම පුංචි ම පුංචි මිනිස්සු
හත් දෙනෙක් හිටියා.

"අනේ ඇයි මට
හෙලවෙන්නවත් බැරි? මාව
ගැටගහලා" උැවෙන්ඩා
කිව්වා.



"හැමෝම එන්න, අපි මෙයාව රජතුමා ගාවට ගෙනියමු" කුරුමිට්ටෙක් කිව්වා.

හැමෝම එකතු වෙලා ලැවෙන්ඩාව රජතුමා ගාවට ගෙනිච්චා.

රජතුමා හිටියේ යෝධ බිම්මලක.

"මෙයාව සිර භාරයට ගන්න". රජතුමා අණකළා.



සෙබලු මාව හිර කළා. මම රෑ වෙනතුරු හිටියා.



සෙබලු නිද්‍රා ගත්තා.
මම සද්ද නැතුව කූඩුවේ දොර ඇද්දා. කූඩුවේ දොර ගැලවුණා.

මම කූඩුවෙන් එළියට ආවා.



මම ටිකක් දුර ගියා. එතන කුරුම්ට් ගම්මානයක්. හැම තැනම සෙබලු. ඒ වගේම කුරුම්ට්ටෝ. මම මේ ලෝකයෙන් යන්න ක්‍රමයක් කල්පනා කළා.

මම කලබල වෙලා එහෙ මෙහෙ දිවුවා. මගේ අත වැදිලා වීදුරුවක් බිඳුණා. ඒ සද්දෙට කුරුම්ට්ටෝ ආවා. කුරුම්ට්ටෝ මාව රජතුමා ගාවට ඇරගෙන ගියා.

“මෙයාව මරන්න” රජතුමා අණ කළා.



කුරුමිට්ටෝ මගේ ඇස් බැන්දා. කෑ ගහන සද්ද ඇසුණා. මට බය හිතුණා.
ඇස්වල බැඳලා තිබ්බ පටිය ලිහුවා. එතන ලොකු බිලි පූජාවක්. එතන ඇස් ලොකු අය හිටියා.

"දැන් මගේ වාරෙ" උැවෙන්ඩා කිව්වා.

ඉර අඳුරු වෙලා.
කුරුමිට්ටෝ කලබල වෙලා.

“මේක සූර්ය ග්‍රහණයක්”

ලැවන්ඩාට කියවුණා කුරුම්ට්ටෝ ටිකක් රජතුමා ගාවට ගිහින් කිව්වා අර යෝධයාව මරණ එකේ ශාපය තමයි මේ රජතුමනි. ඒක නිසා අපි ඒ යෝධයාව නිදහස් කරමු” කුරුම්ට්ටෝ රජතුමාට කිව්වා.

එතකොටම සූර්යග්‍රහණය ඉවර වුණා. තද හිරු එළියෙන් චන්ද්‍රයා ගිණි බෝලයක් සේ දිස් වුණා.



කුරුමිට්ටන් හිස් ලූලූ අත දිව්වා. එතන ලොකු කලබලයක්. මමත් කඩිමුඩියේ එතනින් පැන ගත්තා. ඊට පසුව ඉදිරියටම ගියා. අත් දෙකත් තදින් ගැට ගසා ඇති නිසා රිදෙනවා.

එතකොට මම දුටුවා, රහස් සංකේත සහිත ගල් දොරක් වැනි දෙයක්. මම හැංගෙන්න ඒ ළඟට ගියා. අහෝ ! පුදුමයකි, ඒක ගල් දොරක් තමයි. එවිට විශාල ශබ්දයක් සමඟ එම ගල් දොර ඇරුණා.

ලොකු එළියක් ආවා. මම පාවෙනවා වගේ මට දැනුණා. ආයෙත් මට සීතලක් දැනුණා. මට ඇහැරෙන කොට මගේ ගෙදර පෙනෙන දුරක මම හිටියා.

මම අමාරුවෙන් අත් දෙක ලිහා ගත්තා. රතු මල් මාලය ගලවා විසි කර ගෙදර දිවුවා. වෙලාව පාන්දර හතරයි.

ඉරිදා නිසා මම දහවල් වී නැගිට්ටා.

කුරුමිට්ටන්ගේ ලෝකයෙන් දවස් තුනක් ගියාට මිනිස් ලෝකයෙන් පැය 6 යි. මට හරිම පුදුමයි.

මම උදේ වුණාට පස්සේ මගේ හොඳම යාළුවාට මේ සිද්ධිය කිව්වා. ඇයට සිනාව නවතා ගන්න බැරි වුණා. මම ඇයට මාව ගැට ගැසූ ලණුයි, මල් මාලයයි පෙන්වූවා. ඇයට හීන් දාඩිය දැමුවා.

ස්තුතියි.



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල' අධ්‍යාපනයේ ගුණාත්'මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)